රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

| | | | |
|---|---|---|---|
| දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk | ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை. / Independence Square, Colombo 07, Sri Lanka. |

වෙබ් අඩවිය/ வெப்தளம் / Website : www.pubad.gov.lk


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: රාපරි/අවි/06/01/101 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2026.02. 20 |

පාලන අංශය
23 FEB 2026

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය.

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ ආයතනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පිළියෙල කරන ලද අභ්‍යන්තර විගණන වාර්තාවේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ලේකම්තුමාගේ අනුමැතිය ලැබී ඇති අතර, ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ වාර්තාව මේ සමඟ ඔබ වෙත ඉදිරිපත් කරමි.

02. උක්ත වාර්තාවෙහි දක්වා ඇති විගණන නිරීක්ෂණ හා නිර්දේශ සම්බන්ධයෙන් ඔබගේ අදහස් හා ගනු ලබන ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව මසක් ඇතුළත අභ්‍යන්තර විගණන අංශය දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

.............................
එස්. පී. ගාමිණී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ
ලේකම් වෙනුවට

දුරකථන අංකය - 011- 2667171 ( අභ්‍යන්තර අංකය - 134/ 135 )
ෆැක්ස් අංකය - 011- 2683135
විද්‍යුත් තැපැල් ලිපිනය - intdpubad@gmail.com

පිටපත :- 01. විගණන අධිකාරී (රාජ්‍ය පරිපාලන) - අ. ක. ස.

02. අභ්‍යන්තර විගණක (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය) - අ. ක. ස.

Urgent

Mr. Thilan KFO
Pls. Action

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

රාජ්‍ය පරිපාලන අංශය | பொது நிருவாகப் பிரிவு | Public Administration Division

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk
ලිපිනය / முகவரி / Address: නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකා. / சுதந்திரச் சதுக்கம் கொழும்பு 07 இலங்கை. / Independence Square, Colombo 07, Sri Lanka.
වෙබ් අඩවිය/ வெப்தளம் / Website : www.pubad.gov.lk

මගේ අංකය / எனது இல / My No: රාපරි/අවි/06/01/101
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2026.02.13

ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

**2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ අභ්‍යන්තර විගණන පරීක්ෂාව - (ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය)**

**විගණන පසුබිම**

ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම හා මු.රෙ.133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2025 හා 2025.04.28 දිනැති චක්‍රලේඛයේ නියමයන් පරිදි , ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන පරීක්ෂාවක් සිදුකරන ලදී.

**විගණන විෂය පථය**

විගණනයේදී පහත ලේඛණ හා වාර්තා පරීක්ෂා කිරීම සිදුරන ලදී.

1) 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත.
2) 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සඳහා පනවා ඇති නියෝග.
3) ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ
4) තොරතුරු නිලධාරීන් විසින් පවත්වාගෙන යනු ලබන ලිපි ගොනු හා ලේඛන
5) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ ප්‍රධාන වෙබ් පිටුව තුල අන්තර්ගත කර ඇති තොරතුරු.

විගණන අරමුණු

- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අවශ්‍යතා හා නියෝග සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

- 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අවශ්‍යතාවයන් අනුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවියේ තොරතුරු යාවත්කාලීනව පවත්වාගෙන යාමේ ප්‍රගතිය පරීක්ෂා කිරීම.

නිරීක්ෂණ

i. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 08 හා 09 වගන්ති ප්‍රකාරව ප්‍රකාශයට පත් කළ යුතු වාර්ෂික හා අර්ධ වාර්ෂික වාර්තා සකස් කර අදාල ආයතන වෙත කාලීනව ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

ii. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 10 වගන්තිය ප්‍රකාරව පිළියෙල කලයුතු වාර්ෂික වාර්තා පිළියෙල කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර නොමැති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

iii. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අංක 26(1) අනුව කාර්යාල පරිශ්‍රය තුල ප්‍රකටව පෙනෙන ස්ථානයක කොමිෂන් සභාව හා සම්බන්ධ වීමේ විස්තර, තොරතුරු නිලධාරියා සම්බන්ධ විස්තර , නම් කල නිලධාරයාගේ විස්තර සහ ඕනෑම තොරතුරක් ලබා ගැනීම සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳ විස්තර ඇතුලත් නිවේදනයක් කාර්යාල පරිශ්‍රය තුල හා ස්වකීය වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය කල යුතු බව දක්වා ඇතත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනීය වෙබ් අඩවිය තුල හෝ ආයතන පරිශ්‍රය තුල එවැනි නිවේදනයක් ප්‍රදර්ශනය නොවන බව විගණනයේදි නිරීක්ෂණය විය.

iv. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 17 ට අනුව සෑම පොදු අධිකාරියක් විසින්ම පනතේ විධිවිධාන පරිදි තොරතුරු සැපයීම වෙනුවෙන් ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර ඇතුලත් ලේඛනයක් පවත්වාගෙන යායුතු බව දක්වා ඇතත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පාලන අංශය තුල මෙම තොරතුරු ඇතුලත් ලේඛනයක් නොමැති බව නිරීක්ෂණය විය.

v. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 ට අනුව ප්‍රගාමී තොරතුරු ප්‍රකාශයට පත්කිරීමේ අංක vi යටතේ අයවැය තොරතුරු හා අපේක්ෂිත අයවැය තොරතුරු ප්‍රදර්ශනය කර දැක්විය යුතු වුවත් ඒ සම්බන්ධ තොරතුරු ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය නොවන බව නිරීක්ෂණය විය.

vi. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 යටතේ ප්‍රගාමී තොරතුරු ප්‍රකාශයට පත්කිරීමේ අංක x යටතේ ප්‍රකාශයට පත්කල යුතු ප්‍රසම්පාදන තොරතුරු - ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ කාර්යය පටිපාටිය , නිර්ණායක, ගන්නා ලද තීරණ, ටෙන්ඩර් අයදුම්පත් භාර ගැනීම, ගිවිසුම් පිටපත්, ගෙවුම් වාර්තා, කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීම ඇතුලු විස්තරාත්මක තොරතුරු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය නොවන බව නිරීක්ෂණය විය.

vii. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 යටතේ ප්‍රගාමී තොරතුරු ප්‍රකාශ කිරීම් අංක xiv යටතේ තොරතුරු අයිතිවාසිකම පිළිබඳ තොරතුරු - තොරතුරුවලට ප්‍රවේශවීම පිළිබඳ තොරතුරු,

තොරතුරු ඉල්ලා සිටිය හැකි ආකාරය , ඒ සඳහා ආයතනයෙහි සම්බන්ධ කරගත හැකි පුද්ගලයින් හා ඔවුන් සම්බන්ධ කර ගත හැකි ආකාරය සම්බන්ධ තොරතුරු වෙබ් අඩවියේ ප්‍රදර්ශනය නොවන බව නිරීක්ෂණය විය.

viii. 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ නියෝග අංක 04 ( ii ) යටතේ දක්වා ඇති ආකාරයට RTI 01 ආකෘති පත්‍රයට අනුව පිළියෙල කල අයදුම්පත්‍රය විද්‍යුත් මාධ්‍යයෙන් ලබා ගැනීමේ පහසුකම් සැපයිය යුතු වුවත් මේ සඳහා අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ වෙබ් අඩවිය තුල සපයා නොමැති බව නිරීක්ෂණය විය.

<u>උක්ත නිරීක්ෂණ මත පදනම්ව පහත නිර්දේශ ඉදිරිපත් කරමි.</u>

i. ඉහතින් නිරීක්ෂණය කරන ලද අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහාත් තොරතුරු දැනගැනීමේ පනත මගින් අපේක්ෂිත ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් කාලීනව ඉටුකිරීමට හැකිවන පරිදි සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාවට නංවන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

ii. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අංක 8, 9 හා 10 වගන්ති ප්‍රකාරව හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අංක RTI/01/2022 ප්‍රකාරව ඉදිරිපත් කල යුතු වාර්ෂික වාර්තා හා අර්ධ වාර්ෂික වාර්තා කාලීනව කොමිෂන් සභාව වෙත යොමු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

iii. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අංක 8, 9 හා 10 වගන්ති ප්‍රකාරව හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛ අංක RTI/01/2022 ප්‍රකාරව ඉදිරිපත් කල යුතු වාර්ෂික වාර්තා හා අර්ධ වාර්ෂික වාර්තා වෙබ් අඩවිය තුල යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාවට නංවන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

iv. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 මගින් විද්‍යුත් හා තාක්ෂණික ආකෘතින් සෑම පොදු අධිකාරියක් විසින්ම අවම වශයෙන් ප්‍රකාශයට පත් කළයුතු කරුණු xvi යටතේ නම් කර ඇති අතර , එම ප්‍රගාමී තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාවට නංවන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

v. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ නියෝග අංක 04 ( ii ) යටතේ ඇති අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා තොරතුරු ඉල්ලීම සඳහා යොදා ගනු ලබන RTI 01 අයදුම්පත්‍රය බාගත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ නිල වෙබ් අඩවියේ ඇතුලත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

vi. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අනුව ප්‍රසිද්ධ කර ඇති නියෝග අංක 17 ට අනුව තොරතුරු සැපයීම වෙනුවෙන් ගෙවන ලද ගාස්තු පිළිබඳ විස්තර අඩංගු ලේඛනයක් පවත්වාගෙන යාම සඳහා වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

vii. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ අංක 26(1) අනුව කාර්යාල පරිශ්‍රය තුල ප්‍රකටව පෙනෙන ස්ථානයක කොමිෂන් සභාව හා සම්බන්ධ වීමේ

විස්තර, තොරතුරු නිලධාරියා සම්බන්ධ විස්තර ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

viii. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 ට අනුව ප්‍රගාමී තොරතුරු ප්‍රකාශයට පත්කිරීමේ අංක vi යටතේ අයවැය තොරතුරු හා අපේක්ෂිත අයවැය තොරතුරු වෙබ් අඩවිය තුල ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

ix. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 5.4 හා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 හි x ප්‍රකාරව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මගින් සිදුකරන ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර වෙබ් අඩවියේ ඇතුලත් කිරීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

x. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 15 (ඇ) ප්‍රකාරව පනවා ඇති නියෝග අංක 20 යටතේ ප්‍රගාමී තොරතුරු ප්‍රකාශ කිරීම් අංක xiv යටතේ තොරතුරු අයිතිවාසිකම පිළිබඳ තොරතුරු - තොරතුරුවලට ප්‍රවේශවීම පිළිබඳ තොරතුරු, තොරතුරු ඉල්ලා සිටිය හැකි ආකාරය , ඒ සඳහා ආයතනයෙහි සම්බන්ධ කරගත හැකි පුද්ගලයින් හා ඔවුන් සම්බන්ධ කර ගත හැකි ආකාරය සම්බන්ධ තොරතුරු වෙබ් අඩවියේ ඇතුලත් කිරීමට පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් ලබා දීම සුදුසු බව නිර්දේශ කරමි.

.......................................

එස්.පී.ගාමිණී,
ප්‍රධාන අභ්‍යන්තර විගණක,

දුරකථන : 011 - 2667171
ෆැක්ස් : 011 - 2683135
විද්‍යුත් ලිපිනය : intdpubad@gmail.com